සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 01 හා 02 ප්‍රශ්නවල දී ඇති හිස්තැනට සුදුසු යෙදුම වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

01 දිසාපාමොක් .................................................... ( ආචාරීන් / ආචාරීහු ) කුමරුට ශිල්ප ඉගැන්වූහ.

02 මහලු .................................................................. ( ස්ත්‍රියක් / ස්ත්‍රියක ) තල වේළමින් සිටියා ය.

- 03, 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

03 (i) විශිෂ්ඨ (ii) මර්ධනය (iii) ලේඛණය (iv) ශීඝ්‍රගාමී

04 (i) කසළ (ii) ප්‍රදර්ශණය (iii) පරිඝණකය (iv) ගැහැණිය

- 05 - 10 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05 උපසර්ගයක් යෙදී ඇති වචනය වන්නේ,

(i) විල්වලින් (ii) වනයෙහි (iii) අභිමානය (iv) අවම

06 දී ඇති වාක්‍යාංශයට ගැළපෙන තනි පදය තෝරන්න.

"කිසිවෙකුට බැඳීමක් නැති"

(i) පරාධීන (ii) ආත්මාර්ථකාමී (iii) දේශීය (iv) ස්වෛරී

07 මධ්‍යම පුරුෂ බහු වචන නාම පදය

(i) මම (ii) ඔවුහු (iii) නුඹලා (iv) තෝ

08 මිශ්‍ර ක්‍රියා පදය වන්නේ,

(i) ගොස් (ii) නට නටා (iii) ගියේය (iv) ලියයි



EXAMRESULTS.LK

09 බහුවචන අනුක්ත නාම පදයක් නොවන්නේ,

(i) තොපි (ii) කුරුල්ලන් (iii) අප (iv) ඔවුන්

10 අභිකුණ්ඨික භාෂාවෙන් රෝලු යනුවෙන් හඳුන්වන්නේ,

(i) පිහිය (ii) කුල්ල (iii) වංගෙඩිය (iv) හිරමණය

- **අංක 11 සහ 12 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය සම්පූර්ණ වීමට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11 දෙම්පියෝ ........................................ ආරක්ෂා කරති. ( දරුවන් / දරුවෝ )

12 ........................................................ දහම් දෙසති. ( නාහිමියන් / නාහිමියෝ )

- **අංක 13 හා 14 යන ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

13 අවමාන - ( අසමාන / නිමාන / සම්මාන )

14 මෛත්‍රී - ( වෛරී / ක්‍රෝධ / කරුණා )

15 දී ඇති වාක්‍යය නිවැරදිව පද බෙදා නැවත ලියන්න.

කටු පඳුරු වලින් ගහනවූ වනයෙ හි ඇවිදීම අපහසුය.

..........................................................................................................................................

- **අංක 16 හා 17 ප්‍රශ්නවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.**

16 ළමයි වතුරට <u>පැන</u> සෙල්ලම් කළහ.

( අවසාන ක්‍රියා / මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා )

17 ශිෂ්‍යයෝ හොඳින් පාඩම් <u>කරති</u>.

( මිශ්‍ර ක්‍රියා / අවසාන ක්‍රියා / පූර්ව ක්‍රියා )

18 දී ඇති කවියේ ඉදිරි පද සම්පූර්ණ කරන්න.

මා වැනි බිලින්දා

වර වර ළඟට කැන්දා

..................................................................................

..................................................................................

19 දී ඇති පදවල උක්ත පද ලියන්න.

(i) කම්කරුවන් - ................................................ (ii) ශිෂ්‍යයෙකු - ................................................

20 මේ කවි පදයේ ඉරි ඇඳි කොටසේ ඇතුළත් යෙදුම කුමක්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

දිලිහි දිලිහි ආකාසේ බබළන <u>මල් තාරුකා</u>

( අනුප්‍රාසය / රූපක / උපමා ) (ලකුණු 2 x 20 = 40)

**7 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) නූතන සිංහල හෝඩියේ මහාප්‍රාණ අක්ෂර ගණන කීයද? ඒවා ලියා දක්වන්න.

(ii) රාජකාරි ලිපියක ආකෘතියේ ඇති ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(iii) සිනා කුමරි, කෝමල රේඛා වැනි කාව්‍ය නිර්මාණ කළ රචකයා කවුද?

(iv) (අ) ප්‍රථම පුරුෂ බහු වචන අතීත කාල ක්‍රියා පදයක් ලියන්න.

(ආ) මධ්‍යම පුරුෂ ඒක වචන නාම පදයක් ලියන්න.

(v) මේ වචනවල අරුත් පැහැදිලි කර ලියන්න.

(අ) පරිශ්‍රය

(ආ) ආචාරි භාග (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.

(අ) ගැමි දිවියේ මිහිර

(ආ) වැඩිහිටියන් සුරකිමු.

(ඉ) අධ්‍යාපනය තුළින් දිවි මග සාර්ථක කර ගනිමු.

(ඊ) ගංවතුරකට මැදි වීම්. (ලකුණු 20 යි.)

03 ඔබ පාසලේ දිනපතා එකතුවන කැලි කසළ බැහැර කිරීම ක්‍රමවත්ව සිදු නොවේ. මේ නිසාම පාසලේ දරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ පා ඇත. මෙම කරුණු පැහැදිලි කරමින් ගැටලුවට වහා විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවෙන රාජකාරි ලිපිය ලියන්න. ඔබ පාසල් 'පරිසර කමිටුවේ' ලේකම් යැයි සිතන්න. (ලකුණු 10 යි.)

04 පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මේරි අම්මා දෑත බැඳගෙන
තව ම ගාථා කියනවා
හිතේ බුදු සිරිපතුල ඇඳගෙන
හිතෙන් පැදකුණු කරනවා
ආයෙමත් බිම බලනවා
පුංචි නෝනා නිවන් යන දා
නිවන් දොරටුව ගේට්ටුව ළඟ
පාවහන් දෙක බලාගෙන මම
නිවී සැනසී ඉන්නවා
එහෙම ඉඳගෙන වඳිනවා
ඒ පිනත් මම පුංචි නෝනට
අනුමෝදනා කරනවා .....

(i) කවියේ කියවෙන මේරි නෝනාගේ රැකියාව කුමක් ද?

(ii) කවියේ සඳහන් නාම විශේෂණ පද දෙකක් ලියන්න.

(iii) මෙහි ඇතුළත් රූපකයක් ලියා දක්වන්න.

(iv) පුංචි නෝනා නිවන් යන දිනයේ මේරි නෝනාට පැවරී ඇති කාර්යය කුමක් ද?

(v) මේවාට සමානාර්ථ පද ලියන්න.

(අ) පාවහන් (ආ) ගේට්ටුව (ලකුණු 2 x 5 = 10)

05 පහත වාක්‍යය නිවැරදි කර ලියන්න.

(i) අපි වලසෙක් දැක බියට පත්වීමු.

(ii) අලුයම කුකුළන් හඬලති.

(iii) ගංගා පිටාර ගලති.

(iv) නුඹලා හොඳින් පාඩම් කළෙහි ද?

(v) ගුරුවරුන් අපට හොඳ නරක කියා දෙති. (ලකුණු 2 x 5 = 10)

06 දී ඇති උද්ධෘතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ඇයි ආචාරිනී, තොපි මරණ තළලේ තබා අවු ද? "

(i) ප්‍රකාශය කළේ කවුද?

(ii) මරණ තළලේ තබා අවුද? යන්නෙන් අදහස් කළේ කුමක් ද?

(iii) මෙය උපුටාගෙන ඇති පාඩම කුමක් ද?

(iv) පාඩම ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(v) ප්‍රකාශය ඇසූ ආචාරීන් කීවේ කුමක් දැයි ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 2 x 5 = 10)